

# ලංකාවේ රජවරු

## පළවෙනි කොටස

ටැප් එඩුයුටේයින්මන්ට් ප්‍රකාශනයක්

## 1.පණ්ඩුකාභය රජතුමා

ලංකාවේ ජලාශ්‍රිත ශිෂ්ඨාචාරය ක්‍රමවත් අයුරින් ස්ථාපිත කරලීමට ඉමහත් වැයමක් දැරූ ආරම්භකයා වශයෙන් පණ්ඩුකාභය රජතුමාට සුවිශේෂි ස්ථානයක් හිමිවෙනවා. එතුමා ක්‍රිස්තු පූර්ව 377 සිට ක්‍රිස්තු පූර්ව 307 දක්වා වසර හැත්තෑවක පමණ කාලයක් අනුරාධපුර මුල්කරගෙන රජකම් කරණ ලදි. විජය රජතුමාගේ මරණයෙන් පසු උපතිස්ස නම් ඇමතියා රාජ්‍ය පාලනය කල අතර පණ්ඩුවාස දේව කුමාරයා ඉන්දියාවේ සිට පැමිණි පසු ඔහුගෙන් රාජ්‍ය පාලනය භාරගන්නා ලදි.ඔහුගේ මෙහෙසිය වුයේ භද්දකච්චානා කුමරියයි. මොවුන් දෙදෙනාට පුත්‍රයන් 10 දෙනෙකු හා චිත්‍රා නම් දුවක් ද සිටින ලදි. භද්දකච්චානා බිසවගේ සොහොයුරෙකු වන දිඝායු කුමාරයාට දාව මෙම චිත්‍රා කුමරියට ලැබුණු පුත්‍රයා පණ්ඩුකාභය නම් විය.



චිත්‍රා කුමරියගේ මාමා වරුන්ට චිත්‍රා කුමරියට ලැබෙන පිරිමි දරුවෙකුගෙන් අපල ඇති වන බව අනාවැකි කරුවන් ප්‍රකාශ කර තිබුනා.මේ නිසා චිත්‍රා කුමරියගේ මාමා වරුන්ට හොර රහසේ ඇගේ පිරිමි දරුවා ගැහුණු දරුවෙකුට මාරු කර පණ්ඩුකාභය කුමාරයාව රජ මලිගයෙන් පිටකරණ ලදි. පණ්ඩුකාභය කුමාරයා දොරමඩලාව නම් ප්‍රදේශයෙ ළමා කාලය ගත කළ බව ඉතිහාස පොත් වල සදහන් වෙනවා.එහිදි පණ්ඩුල නම් බමුණාගෙන් ශිල්ප ඉගෙන ගෙන වැඩිවර්ධන වි සුදුසු කාළය පැමිණි විට තම මාමා වරු සමග සටනට එළඹ රජකම ලබාගන්නා ලදි.එතුමා රජවීමෙන් පසු අනුරාධපුර නගරය නිර්මාණය කර එහි සිට තම රාජ්‍ය පාලන කටයුතු කරගෙන යන ලදි.

මෙතුමා ඉතා සංවිධානාත්මකව අනුරාධපුර නගරය සැලසුම් කර විවිධ නිලතල ඇතිකරමින් විශාල කාර්යභාරයක් නගරය සංවර්ධනයේලා ඉටුකරණ ලදි. අනුරාධපුරයේ තිබූ ලංකාවේ ප්‍රථම වාරිකර්මාන්තය වු බසවක්කුලම වැව විශාලකර සෑදවීමද මේතුමාගේ කාලයේ සිදුවිය. රාජ්‍යයේ හි සියලුම ප්‍රදේශ වල සීමාවන් ඇතිකරණ ලද අතර විවිධ ආගමික ඇදහිලි සදහා දේවාල අසපු වැනි ස්ථාන ද ඇතිකරණ ලදි.මෙතුමාගෙන් පසු ඔහුගේ පුත්‍ර මුටසීව කුමාරයා රජකමට පත්විය.

## 2.දේවානම් පියතිස්ස රජතුමා



මුටසිව රජතුමාගේ පුත්‍රයන් දස දෙනාගෙන් හා දියණියන් දෙදෙනාගෙන් දෙවන පුත්‍රයා වන තිස්ස කුමාරයා මුටසිව රජතුමාගෙන් පසු රජකමට පත් විය.මෙතුමා ක්‍රි.පූ.307 සිට ක්‍රි.පූ.267 දක්වා රජකම් කරන ලදි.සිංහල බෞද්ධ සංස්කෘතිය ආරම්භකරණු ලැබුවේ මෙතුමා විසිනි.

එතුමා ඉන්දියාවේ අශෝක රජු සමග පැවැත්වූ සම්බන්ධතා නිසා තම රාජාභිෂේකයේ වටිනා වස්තු අශෝක රජතුමාට යැවූ අතර ඒ සදහා අශෝක රජතුමා විසින් “දේවානම්පිය” යන ගෞරව නාමයත් ආර්ය අභිෂේකයකට අවශ්‍ය භාණ්ඩත් එවන ලදි.

අශෝක රජුගේ පුත්‍රයා ලෙස සැලකෙන මිහිදු මාහිමි ප්‍රමුඛ පිරිවර බුද්ධ ධර්මය රැගෙන මෙරටට පැමිණීමත් දෙවානම්පියතිස්ස රජතුමා දිවයින පුරා බුද්ධාගම ව්‍යාප්ත කිරීමත් නිසා රට තුල සිටි පිරිස අතර එකමුතු කම වැඩිකිරීමත් පොදු භාෂාවක් වශයෙන් සිංහල භාෂාව ප්‍රචලිත කිරීමත් සිදු කරණ ලදි. මෙතුමා මහ මෙවුනා උයන හා එහි මාලිගය සඟ සතු කොට පුජා කිරීම,ථූපාරාමය ඉදි කිරීම,සංඝමිත්තා තෙරණිය වැඩමවා ගෙන එම හා ශ්‍රී මහා බොධි ශාඛාව ගෙන ඒම ,මෙහෙනි සස්න ඇතිවීම හා විශාල වෙහෙර විහාර ප්‍රමාණයක් ඉදි කිරීමද සි දු ක ර ණ ලදි.



එසේම අනුරාධපුරය ආසන්නයේ තිසා වැව ගොඩ නගා ගොවිතැන දියුණු කිරීමටද විශාල සේවාවක් කරන ලදි.

## 3. දුටුගැමුණු රජතුමා

දේවානම් පියතිස්ස රජුගේ සොහොයුරන්ගෙන් පසු තවත් ආක්‍රමණිකයන් කිහිපදෙනෙකු හා එළාර රජු විසින් ලංකාව පාලනය කිරීම සිදු කරණ ලදි.දේනම්පියතිස්සගේ බාල සොහොයුරෙක් වු මහානාග කුමරු රුහුණෙ මාගම රාජ්‍යයක් පිහිටුවාගත් අතර ඔහුගේ පුත් කාවන්තිස්සට දුටුගැමුණු හා සද්ධාතිස්ස නමින් පුත් කුමාරවරුන් දෙදෙනෙකු විය.ඔවුන්ගේ මව වුයේ කැළණි රාජ්‍යයේ රජ කල කැළණිතිස්ස රජුගේ දුව වු දේවී කුමරියයි.

කාවන්තිස්ස රජුගේ කාලයේ රජරට පාලනය කල එළාර පැරදවීම සදහා විශාල වශයෙන් හමුදා සංවිධානය කිරීමද අනෙකුත් ප්‍රදේශිය රාජ්‍යයන් තම බලය යටතට ගැනිමද සිදුකල අතර රජුගේ මරණයෙන් පසු දුටුගැමුණු කුමාරයාට මාගම රාජ්‍යයේ බලය හිමි වු අතර එයට ඔහුගේ මව වු විහාර මහා දේවියගේ අවවාද අනුශාසනා ද ඉවහල් විය.





දුටුගැමුණු රජතුමා සුදුසු වේලාවේදි තම සේනා මාගම සිට රජරටට තිබු මාර්ග ඔස්සේ බුත්තල හරහා මහියංගනයට ලගාවි එළාරගේ පලමු බලකොටුව බිද දමා මාගංතොටින් මහවැලි ගග තරණය කර රජරටට ඇතුල් වි එළාරගේ ප්‍රධාන බලකොටුව වු විජිතපුර බලකොටුවට ද යටත් කරගන්නා ලදි. පසුව අනුරාධපුරයටද ඇතුල් වි එයද ජය ගෙන රජවරුන් දෙදෙනා අතර පැවති සටන ද දුටුගැමුණු රජු විසින් ජය ගතතේය.මේ අතර වාරයේදි ඉන්දියාවෙන් පැමිණි එළාරට සහය දක්වන සේනාවන්ටද මුහුණ දි ජය ගැනිමට මාගම් පුර සේනාව සමත් විය.ක්‍රි.පු.161 දි දුටුගැමුණු රජු අනුරාධපුර නගරයේදි අභිෂේක ලබා ක්‍රි.පු.137 දක්වා රජකම් කරණ ලදි.

මෙතුමා විසින් ලොවා මහාපාය නමින් භික්ෂුන් වහන්සේලාට පොහොය කිරිම සදහා විශාල ගොඩනැගිල්ලක් කරවු අතර මිරිසවැටි දැගබ එතුමා සටනට ගෙන ගිය කුන්තායුධ තැන්පත් කර සාදවන ලදි.එතුමා විසින් කරවු විශිෂ්ඨම නිර්මාණය වනුයේ රුවන්වැලිසැය

සැදවීමය.එතුමා විසින් වෙසක් උත්සවය ආරම්භ කිරීම ද විශේෂ සිදුවීමකි.
එසේම වෛද්‍ය ශාලා සැදවීම හා ඒ ආශිත්‍ර සේවා ආරම්භ කිරීම වැනි විවිධ පහසුකම් සැලසීමද සිදුකරණ ලදි.ඔහුගේ මරණින් පසු සද්ධාතිස්ස සොහොයුරා රජ බවට පත්වන ලදි.

## 4.වලගම්බා රජතුමා

සද්ධාතිස්ස රජුගේ බාල පුත්‍රයා.වලගම්බා කුමරු වන අතර ඔහුට පෙර ඔහුගේ සහොදර වරු දෙදනෙක් මෙන්ම මහා රත්තක සෙනවියාද රටේ බලය ලබගන්නා ලදි.මෙතුමාගේ පලමු රාජාභිසේකයෙන් පස් වසක් වන විට විදේශ මෙන්ම දේශිය ආක්‍රමණ වලට මුහුණ දිමට සිදු විය.මෙම එක් සටනක් පැරදි පලා යන විට එතුමා හා පිරිස ගමන් ගත් රථයේ බර වැඩි බව දැන සෝමා නම් දෙවිය රථයෙන් බැස්ස බවත් ඔවුන් ලුහුබැද පැමිණි ද්‍රවිඩ ආක්‍රමණිකයන් සෝමා දෙවියවත් බුදුන්ගේ පාත්‍ර ධාතුවත් ඉන්දියාවට රැගෙන ගිය බව සදහන්වේ.



ආක්‍රමණිකයන් වසර 14 පමණ රට පාලනය කල අතර වලගම්බා රජු රුහුණේ කඳවුරු බැඳ සේනාව රැස් කරවුයේය.පසුව ආක්‍රමණිකයන් පරාජය කර රජකම ලබාගැනිමට එතුමා සමත් විය.

රජු යුද්ධයෙන් පැරදි පලායන විට ගිරිනම් නිගණ්ඨකයා රජුට අවමන් කල බවට සදහන් වි ඇති අතර එම නිගණ්ඨකයා විසු ආරාමයක කඩා අභයගිරි නම් ආරාමයක් තනවන ලදි.එහි මහාවිහාර භික්ෂුන් සමග භේද වු භික්ෂුන් කණ්ඩායමක් පදිංචි විම නිසා වෙනමම නිකායක් ඇතිවිම සිදුවු අතර

මෙතුමාගේ කාලයේ ත්‍රිපිටකය ධර්මය ග්‍රන්ථාරූඪ කිරීම සිදුවිය. එසේම බොහෝ ගල්ලෙන් වල කටාරම් කොටවා භික්ෂුන්ට පුජා කිරීමද සිදුවිය.මෙතුමාගේ කාලයෙන් පසු රාජ්‍යයේ රජකම සදහා බොහෝ ව්‍යාකුල තාවයන් ඇතිවිය.

## 5.මහසේන් රජතුමා



මෙතුමා රජකමට පත්වනුයේ ක්‍රි.ව.276 දි වන අතර එතැන් සිට ක්‍රි.ව.303 දක්වා වසර 30 රජකම සිදුකරණ ලදි. මෙතුමාගේ ගුරු භික්ෂුව වු සංඝමිත්‍ර හිමිගේ අදහස් වලට අවනත වි මහා විහාරික භික්ෂුන්ට විවිධ කරදර උපද්‍රව සිදුකරණ ලදි.මේ නිසා මාහාවිහාරය විනාශ වු අතර එහි වස්තුව අභයගිරියට ගෙන යන ලදි.පසුව මෙතුමා මහා විහාරය නැවත ගොඩනැගිමට කටයුතු කරණ ලදි.

මහසෙන් රජතුමා මින්නෙරිය,හුරුලුවැව,කනදරා,මාමණියා, කවුඩුල්ල,මාගල්ල,මහා ගල්කඩවල වැනි වැව් 11 සාදවන ලද අතර එම සේවය කෘෂිකර්මාන්තයේ විශාල දියුණුවකට හේතු වන ලදි.

ඔහුගේන් පසු ඔහුගෙ පුත් සිරිමෙවන් රජකම ලබාගත් අතර ඔහුගේ කාලයේ ලංකාවට දන්ත හේමමාලා යන බෞද්ධ කුමර කුමරියන් ශ්‍රී දළදාව රැගෙන එන ලදි.

## 6.ධාතුසේන රජතුමා



මෙතුමා ක්‍රි.ව. 59 පමණ රජ වු අතර ඔහු රජකම ලබගන්නේ එවකට රට පාලනය කල ආක්‍රමණික ද්‍රවිඩ රජ පරාජය කිරිමෙනි.මෙතුමා බුද්ධ ශාසනයේ දියුණුවට මෙන්ම කෘෂිකාර්මික දියුණුවට ද විශාල සේවයක් සිදුකරණ ලදි.මෙතුමාගේ කාලයේදි මිහිඳු පෙරහැර පැවැත්විම මහා සෑ තුනෙහි අකුණු නොවදින ආරක්ෂක උපකරණ සවිකිරිම වැනි බුද්ධ ශාසනයේ දියුණුවට හේතු වන ක්‍රියා මාර්ග මෙන්ම කලා වැව ඉදිකිරිම ද සිදුකරණ ලද විශාල සේවාවකි.


මෙතුමාගේ පුත්‍රයෙකු වු කාශ්‍යප සමග බිදවිමක් ඔහුගේ මිගාර නම් සෙනවියා නිසා ඇතිවු අතර අවසානයේ දි කාශ්‍යප විසින් ධාතුසේන රජතුමාව කලාවැවේ වැව් බැම්මට තබා මැටි ගසා මැරවු බව මහාවංශයේ සදහන් වේ.

## 7. 1 වන විජයබාහු රජතුමා

අනුරාධපුර රාජධානිය බිඳ වැටීමෙන් පසු පොළෙ ාන්නරුව දෙසට රාජධානිය ගෙන යන ලදි.මෙතුමා ක්‍රි.ව.1055 දි පළමුවන විජයබාහු ලෙස රුහුණේ රජ වු අතර විවිධ සොලි ආක්‍රමණ හමුවේ පසුබැසීම්ද ජයග්‍රහණ ලැබීම්ද සිදුවු අතර අවසානයේ පොළොන්නරුව ආක්‍රමණය කර සොලින් පරාජය කර නැවතත් රට එක්සේසත් කරන ලදි.

මෙතුමාගේ රාජ්‍ය කාලයේදි පාණ්ඩ්‍යය,බුරුම කාලිංග ආදි දේශ සමග විදේශ සබඳතා ඇතිකරගත් අතර රාමඤ්ඤ රටේ ආධාරයෙන් උපසම්පදාව පිහිටුවීමද තුන්පිටකය වන පොත් කිරීමද බෞද්ධ ගොඩනැගිලි විශේෂයෙන් දළදා මැදුර වැනි ගොඩනැගිලි ඇතිකිරීම,ශ්‍රී පාද වන්දනාව සදහා පහසුකම් සැලසීම එසේම විනාශ වි ගිය සාහිත්‍ය භාෂාව ආගම අධ්‍යාපනය නැවත දියුණ කිරීම මෙතුමා විසින් සිදු කරණ ලද විශිෂ්ට සේවාවන් වේ.

## 8.මහා පරාක්‍රමබාහු රජතුමා



පළමුවන විජයබාහු රජතුමාගෙන් පසුව නැවතත් පොළොන්නරු රාජ්‍යයේ අවුල් වියවුල් ඇති වු අතර දක්ෂිණ දේශයේ පාලන කටයුතු කරගෙන ගිය මෙතුමා යුද සේනා ප්‍රතිසංවිධානය කරවු අතර දක්ෂිණ දේශයේ ආර්ථිකය හා තම පාලනය දියුණු කරගෙන රට එක්සේසත් කිරීමට කටයුතු කරණ ලදි.

අවසානයේ පොළොන්නරුවේ පාලනය ගෙන ගිය දෙවන ගජබා රජු පරාජය කර ක්‍රි.ව.115 දි රජරට පාලනය ද බාරගත්තේය.මෙ-තුමා ක්‍රි.ව.1155 දි හා ක්‍රි.ව.1160 දි ද රට එක්සේසත් කරමින් තුන්වන වරටද අභිෂේකය කරන ලදි.පසුව ඔහු විදේශ

ආක්‍රමණ වලටද යොමු වූ අතර බුරුම දේශය ආක්‍රමණය කිරීම ද සිදුවිය.

මෙතුමා දක්ඛිණ දේශයේ සිටි කාලයෙ දැදුරු ඔය හරස් කර විශාල කෘෂිකර්මික දියුණුවක් එම ප්‍රදේශ වල ඇති කල අතර පොළෙ ාන්නරුව අල්ලාගත් පසු එහි පරාක්‍රම සමුද්‍රය වැනි විශාල වාරි කර්මාන්ත සිදුකරණ ලදි.



පරාක්‍රමබාහු රජතුමා විසින් ඇල මාර්ග වැව් අමුණු ඉතා විශාල සංඛාවක් කරවූ අතර කෘෂිකර්මාන්තයට අමතරව වෙළඳාමද දියුණුකිරීමට පියවර ගන්නා ලදි.

එදිනෙදා ජීවිතයට වැදගත් වන පොත් පත් රාශියක් දැන් නොමිලේම ලබාගැනිමට
ටැප් එඩියුටේයින්මන්ට් ප්‍රකාශන ආයතනයේ නිල වෙබ් අඩවියෙ සියලු පහසුකම් සලසා ඇත.
ඔබට අවශ්‍ය කරන පොත් පත් නොමිලේම ඩවුන්ලෝඩ් කරගන්න පිවිසෙන්න

www.tap.lk

විද්‍යා දැනුම සාමාන්‍යය දැනුම සමග තව බොහෝ
වටිනා ලිපි රාශියකින් යුතුව ලංකාවේ පලවන
එකම සිංහල විද්‍යුත් විද්‍යා සඟරාව නොමිලේම
කියවන්න ඩවුන්ලෝඩ් කරගන්න දැන්ම පිවිසෙන්න
විදුසමය විද්‍යා සඟරාවේ නිල වෙබ් අඩවියට

www.Vidusamaya.com